**පාලක මණ්ඩලය**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2024 පෙබරවාරි 13 මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන විධාන 2024 අංක 01**

## කාලාවර්තක වාර්තා කිරීමේ අවශ්‍යතා

| | |
|---|---|
| 1. නෛතික ප්‍රතිපාදන | 1.1. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 133 වන වගන්තිය සමග කියවිය යුතු 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 (1) වගන්තියට අනුව, කාලාවර්තක වාර්තා කිරීමේ අවශ්‍යතා පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත විධාන ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව පවතියි. |
| 2. විධානවල අරමුණු | 2.1. බලපත්‍රලාභී මුදල් සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතු සිදු කෙරෙන ආකාරය හෝ වෙනත් යම් විශේෂිත අරමුණක් නිශ්චිතව දැනගැනීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්වල කාලීන, නිරවද්‍ය, අඛණ්ඩ සහ පූර්ණ තොරතුරු ලබා ගැනීම. |
| 3. අදාළත්වය | 3.1. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කළ විධාන යටතේ හඳුන්වා දෙන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තොරතුරු ජාල වාර්තාකරණ පද්ධතියේ (FinNet) සියලු කාලාවර්තක වාර්තා සඳහා මෙම විධානය අදාළ වේ. |
| 4. බලපත්‍රලාභී මුදල් සමාගම්වල වගකීම් | 4.1. සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් ම නියමිත අවසාන දින වන විට නිරවද්‍ය, අඛණ්ඩ සහ පූර්ණ කාලාවර්තක වාර්තා යොමු කළ යුතු ය.<br>4.2. සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් ම මෙම විධානය නිකුත් කිරීමෙන් මාස තුනක් ඇතුළත FinNet හි කාලාවර්තක වාර්තාවල නිරවද්‍යතාව, අඛණ්ඩතාව සහ පූර්ණත්වය පිළිබඳ උපදෙස්වලට අනුකූල වීම තහවුරු කිරීමේ වගකීම නිශ්චිත ප්‍රධාන වගකිව යුතු පුද්ගලයෙකු වෙත පැවරිය යුතු ය. ප්‍රධාන වගකිව යුතු පුද්ගලයෙකු නම් කිරීමට අදාළව පසු කාලීනව සිදු කරන යම් වෙනස්කම්, එම වෙනස්කම් සිදු කිරීමෙන් වැඩ කරන දින තුනක් ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත විද්‍යුත් තැපෑලෙන් හෝ ලිපියක් මගින් කඩිනමින් දැනුම් දිය යුතු ය.<br>4.3. පත් කරන ලද ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා කාලාවර්තක වාර්තාවල කාලීනත්වය, නිරවද්‍යතාව, අඛණ්ඩතාව සහ පූර්ණත්වය තහවුරු කිරීමට වගකීමෙන් බැඳී සිටියි. |

| | |
|---|---|
| 5. අනුකූලතාව තහවුරු කිරීම සඳහා වන නියාමන ක්‍රියාමාර්ග | 5.1. යම් කාලාවර්තක වාර්තාවක් සම්බන්ධයෙන් නියම කරන ලද කොන්දේසි සපුරාලීමට අපොහොසත් වන අවස්ථාවක දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම බලපත්‍රලාභී මුදල් සමාගමට සහ අදාළ ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නියාමන ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව පවතියි. |
| 6. නිර්වචන | 6.1. "ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා" මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කළ 2021 අංක 06 දරන ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාව තක්සේරු කිරීම විධානයෙහි 4.1(ආ) වගන්තියෙහි නිර්වචනය කර ඇති ආකාරයේ පුද්ගලයෙකු විය යුතු ය.<br>6.2. "අධ්‍යක්ෂවරයා" යන්නෙන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අර්ථවත් කෙරේ. |
| 7. විධාන වෙත සිදු කෙරෙන සංශෝධන | 7.1. මුදල් සමාගම් පනත යටතේ නිකුත් කළ 2013 අංක 4 දරන ද්‍රවශීල වත්කම් විධානයෙහි 05 වන වගන්තිය, එම වගන්තිය අහෝසි කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, එහි ආදේශනය පහත පරිදි ය:-<br>"සෑම මුදල් සමාගමක් ම පසුව එළඹෙන මාසයේ පහළොස්වන (15 වන) දින වන විට වෙබ් පදනම් කරගත් වාර්තාකරණ පද්ධතිය (FinNet) ඔස්සේ අධ්‍යක්ෂවරයා වෙත ද්‍රවශීල වත්කම්වල විස්තර වාර්තා කළ යුතු ය.";<br>7.2. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කළ 2018 අංක 03 දරන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා විධානයෙහි 2.1 වගන්තිය, එහි (i) උපවගන්තිය අහෝසි කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, එහි ආදේශනය පහත පරිදි ය:-<br>"කාර්තුමය වශයෙන්: සෑම කාර්තුවක ම අවසාන ලිත් දිනයට පවතින තත්ත්වය, පසුව එළඹෙන මාසයේ පහළොස්වන (15 වන) දින වන විට වාර්තා කළ යුතු ය." |

| | |
|---|---|
| 8. විධාන අහෝසි කිරීම | මෙම විධානය නිකුත් කිරීමේ දිනයේ සිට පහත විධාන අහෝසි කෙරෙනු ඇත:<br>8.1. මුදල් සමාගම් පනත යටතේ නිකුත් කළ 2011 අංක 02 දරන වාර්තාකරණ අවශ්‍යතා විධානය<br>8.2. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කළ 2019 අංක 01 දරන තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානයෙහි 4.1 වන වගන්තිය<br>8.3. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කළ 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය විධානයෙහි උපලේඛන (ඇ) හි 07 වන වගන්තිය |

*[අත්සන]*

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ**

*පාලක මණ්ඩලයේ සභාපති සහ*

*ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති*